# මාලිම්බඩ ප්‍රාදේශීය සභාව
# මාතර දිස්ත්‍රික්කය

1 මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 05 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 19 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

(අ) 2010 ජනවාරි 19 දිනැති අංක PED/54 දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ චක්‍රලේඛය අනුව 2011 ජනවාරි 01 දින සිට පළාත් පාලන ආයතන විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළයුතු වුවත් එම ප්‍රමිති අනුගමනය කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඉදිරිපත් කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන සමඟ එකී ගිණුම් පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව්කර නොතිබුණි.

1.3.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී ඉකුත් වර්ෂය වෙනුවෙන් මාර්ග ඉදිකිරීම් සඳහා ගෙවීම් කිරීමේදී එකී මාර්ගවලට අදාල නාමපුවරු ඉදිකිරීම වෙනුවෙන් කොන්ත්‍රාත් සමිති සඳහා ගෙවිය යුතු මුදලින් අඩුකරගන්නා ලද රු.54,000 ක මුදලක් භෞතික සැලසුම් මංමාවත් ඉඩම් හා ගොඩනැගිලි වැඩ සටහන යටතේ වූ ප්‍රාග්ධන වැය ගිණුමට බැර කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වියදම් එකී ප්‍රමාණයෙන් අඩුවෙන් ගිණුම්ගත වී තිබුණි.

(ආ) ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යනු ලබන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියට අදාල පොහොර තොග ලේඛනය අනුව සමාලෝචිත වර්ෂය අවසානයට පැවති කි.ග්‍රෑම් 384 ක පොහොර තොගයේ වටිනාකම ගණනය කර ශේෂ පත්‍රයේ දක්වා නොතිබුණි.

(ඇ) 2013 වර්ෂයේ පළාත් නිශ්චිත කර්මාන්ත යටතේ ගල්ඇන්දකුට්ටිය ප්‍රධාන මාර්ගය අළුත්වැඩියා කිරීම සඳහා වූ කර්මාන්තය වෙනුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට රු.600,000 ක ණයගිම් ප්‍රතිපාදන වෙන්කර තිබුණද, ගෙවීම් වාර්තාව අනුව කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු මුදල රු.537,877 ක් වූයෙන් ප්‍රාග්ධන වියදම රු.62,123 කින් වැඩියෙන් දක්වා තිබුණි.

1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂ 01 කට වඩා කාලය ඉක්මවූ හිඟහිටි වෙනත් ආදායම් රු.8,742,964 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂ 01 ක් හා ඊට වැඩි කාලය ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.6,354,309 ක් විය.

1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

ගිණුම්වල ඇතුළත් රු. 37.743,427 ක් වටිනා විෂයයන් දෙකක් සම්බන්ධව සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

1.3.6 නීති, රීති , රෙගුලාසි ආදියට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| රීති 218 | ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකට වරක් හෝ පරීක්ෂා කිරීමට සභාපතිවරයා විසින් කටයුතු කළයුතු වුවද එසේ කටයුතු කර නොතිබුණි |
| (ආ) 2002 නොවැම්බර් 28 දිනැති 2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිඝනක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.263,252 ක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.598,225 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයයන් | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් බදු | 1,629 | 878 | 102 |
| කුලී මුදල් | 1,861 | 1,994 | 130 |
| වෙනත් ආදායම් | 21,035 | 16,048 | 6,105 |

2.2.2 හිඟ වරිපනම් හා බදු
---------------------

සමාලෝචිත වර්ෂය සඳහා වරිපනම් බදු බිල් කිරීම් රු.146,366 ක්ද (සියයට 10 වට්ටම් අඩුකල පසු) 2013 ජනවාරි 01 දිනට හිඟ ශේෂය රු.101,643 ක්ද සමඟ එකතුව රු.248,009 ක් වූ අතර වර්ෂයේ අයවීම රු.151,457 ක් විය. අයවීමේ ප්‍රතිශතය සියයට 61 ක් වූ අතර පනතේ 158(1) වගන්තිය අනුව ආදායම් අයකිරීමේ නිලධාරියා වන සභාවේ ලේකම්වරයා හිඟහිටි වරිපනම් බදු අයකර ගැනීම සම්බන්ධයෙන් අවධානය යොමු කර නොතිබුණි.

2.2.3 හිඟ අක්කර බදු
----------------

සමාලෝචිත වර්ෂය සඳහා අක්කර බදු බිල්කිරීම් රු.4,272 ක් වූ අතර 2013 ජනවාරි 01 දිනට හිඟ ශේෂය රු. 4,819 ක් සමඟ අයවිය යුතු මුදල රු.9,091 ක් විය. එකී මුළු මුදලින් වර්ෂයේ ලැබීම් රු.2,796 ක් වූ අතර අයවීමේ ප්‍රතිශතය සියයට 30 ක අගයක් විය.

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු
------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතුව තිබූ උසාවි දඩ හා මුද්දර ගාස්තු මුදල් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| උසාවි දඩ | 943,254 |
| මුද්දර ගාස්තු | 5,120,592 |

3. මෙහෙයුම් සමාලෝචනය
------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා
-----------------------------------

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා
------------------------------

3.2.1 වීථිපහන් අළුත්වැඩියා කිරීම
-------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශ ලේකම්ගේ 2010 අගෝස්තු 17 හා අංක පීඊ/01/01 චක්‍රලේඛයේ 1.4 ඡේදය අනුව සභා බල ප්‍රදේශයේ වීථි පහන් නඩත්තු කිරීමේ කටයුතු සිදු වී නොතිබුණු අතර පහන් සවි කිරීමේදී වීථි පහන් වල විදුලි බල පරිභෝජනය අදාල ප්‍රදේශයේ ගාස්තු හා පොදු කාර්යය සිල්ලර පරිභෝජනයෙන් සියයට 3 ට සීමා විය යුතු වුවද සභාව ඒ පිළිබඳ අවධානය යොමුකර නොතිබුණි.

(ආ) සභාව පවත්වාගෙන ගොස් ඇති වීථි පහන් ඉන්වෙන්ට්‍රි ලේඛනය අනුව පහන් කණු සංඛ්‍යාව 1044 ක් වුවද විදුලි බල මණ්ඩලය මගින් බල ප්‍රදේශයට අනුමත කරගෙන ඇති වීථි පහන් සංඛ්‍යාව 91 ක් විය.

(ඇ) විදුලි කාර්මික විසින් ලබාගෙන තිබුණු විදුලි උපකරණ සවිකිරීම පිළිබඳ නඩත්තු වාර්තා අනුව සමාලෝචිත වර්ෂය අවසානයට රු.72,840 ක් වටිනා බල්බ 287 ක තොගයක් සවි නොකොට අත රඳවා ගෙන තිබූ බව නිරීක්ෂණය විය.

3.2.2 ආර්ථික නොවූ ගනුදෙනු

(අ) ඉකුත් වර්ෂයේ අන්තර් සම්බන්ධිත කුට්ටිගල් ව්‍යාපෘතියට රු.175,644 ක මුදලක් වැයකර කුට්ටිගල් නිෂ්පාදන යන්ත්‍රයක් මිලට ගෙන තිබුණි. එකී ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ නොකිරීම නිසා මෙම යන්ත්‍රය වර්ෂ 2 ක පමණ කාලයක් නිෂ්ක්‍රියව තිබුණි.

(ආ) මෙම ව්‍යාපෘතියේ කටයුතු සඳහා රු.68,826 ක මුදලක් මෙම වර්ෂයේදී වැය කර තිබූ අතර, එකී මුදලින්ද ඵලදායි ක්‍රියාවක් සිදුව නොතිබුණෙන් මේ දක්වා වැයකළ රු.244,470 ක මුදල ඵලරහිත වී තිබුණි.

3.2.3 මානව සම්පත් කළමනාකරණය

2013 දෙසැම්බර් 31 දිනට සභාවේ සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| තනතුරු වර්ගය | අනුමත | තථ්‍ය | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|
| තෘතියික | 01 | 02 | | 01 |
| ද්විතියික | 17 | 16 | 01 | |
| ප්‍රාථමික | 21 | 19 | 02 | |
| වෙනත් (අනියම්,තාවකාලික, කොන්ත්‍රාත්) | - | 02 | | 02 |
| | 39 | 39 | 03 | 03 |

(i) සමාලෝචිත වර්ෂයේ පළාත් පාලන කොමසාරිස් වෙතින් කාර්යය මණ්ඩල වැටුප් හා මන්ත්‍රී දීමනා සඳහා රු.7,053,900 ක් ප්‍රතිපූර්ණය කර තිබූ අතර වර්ෂයේ වැටුප් හා දීමනා ලෙස රු.10,850,615 ක මුදලක් වැයකර තිබුණෙන් සභා අරමුදලට රු.3,796,715 ක අතිරේක වැයබරක් ඇති වී තිබුණි.

(ii) මාර්ග ව්‍යාපෘතියක් සඳහා තාවකාලික මාර්ග කම්කරුවන් 06 දෙනෙකු බඳවා ගෙන සමාලෝචිත වර්ෂයේදී රු.668,900 ක වැටුප් ගෙවා තිබුණි. සභාව විසින් මාර්ග ව්‍යාපෘතියක් ඇති කිරීම හා ඒ සඳහා අවශ්‍ය සේවකයින් ප්‍රමාණය දක්වමින් දකුණු පළාත් පාලන කොමසාරිස්වරයාගෙන් අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

සභාවේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් පවත්වා නොතිබුණි.

4.2 විගණන හා කළමනාකරණ කමිටු

සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

4.3 ප්‍රසම්පාදන සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා 2006 ජනවාරි 25 දිනැති අංක ජී.ප්‍ර.නි./ප්‍ර.වි.නි./18 දරන චක්‍රලේඛයේ 42(ආ) ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

4.4 අයවැය පාලනය

අයවැයගත ආදායම් හා වියදම් අතර, සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් සභාවේ අයවැය ලේඛනය ඵලදායි මූල්‍ය පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන තිබුණ බව නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලන

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය